# දැන්වීමයි

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

### 01. සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) - ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණය (HM 1-1) - තනතුරු 01

HM 1 - 1 - රු. 80,295 - 15 x 2,270 - 114,345/-

රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහාද හිමිකම් ලබනු ඇත. (2022.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රු. 80,295/- ක් වේ.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / වාණිජවේදී විෂයන්ගෙන් ලබාගත් උපාධිය

සමග

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. කළමනාකරණ සේවා (MM) ගණයේ 1 ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

### 02. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) - ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණය (HM 1-1) - තනතුරු 01

HM 1 - 1 - රු. 80,295 - 15 x 2,270 - 114,345/-

රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහාද හිමිකම් ලබනු ඇත. (2022.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රු. 80,295/- ක් වේ.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / නීතිය / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලනය උපාධිය

සමග

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. කළමනාකරණ සේවා (MM) ගණයේ 1 ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම,**

a. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
b. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
c. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය**

පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගනු ලැබේ. සේවක අර්ථ සාධක අරමුදලට පත්වීම් ලාභීන්ගෙන් 8% ක් ද සේවා යෝජකයාගෙන් 12% ක් වශයෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඊට අමතරව සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට පත්වීම් ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් ගෙවනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීවදත්ත සහ අදාළ සහතික වල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතික වල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් **සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, නො. 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම** යන ලිපිනයට 2022.12.23 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ sladcvacancies@gmail.com යන ඊමේල් ලිපිනයට එවිය යුතුය. ඔබගේ දුරකථන අංකය සහ ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් සහ දුරකථන අංකයන් අයදුම්පතෙහි සඳහන් කර තිබිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ කෙළවරේ සහ ඊමේල් පණිවුඩයේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඉහත තනතුරු කිහිපයකට අයදුම්කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුයි.

තැපැලෙන් අස්ථානගතවන හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.**